සැබැවින්ම මෙලොව ශාප කරනු ලබන්නකි. එමෙන්ම එහි ඇති දෑ ද ශාප කරනු ලබන්නකි. නමුත් අල්ලාහ්ව මෙනෙහි කිරීම, ඔහු සමීප කරගත් දෑ හා දැනුම ලද්දා හෝ දැනුම හදාරන්නා හැර

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කරමින් සිටි ප්රකාශයකට මම සවන් දී ඇත්තෙමි යැයි පවසා අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන
ලදී: "සැබැවින්ම මෙලොව ශාප කරනු ලබන්නකි. එමෙන්ම එහි ඇති දෑ ද ශාප කරනු ලබන්නකි.
නමුත් අල්ලාහ්ව මෙනෙහි කිරීම, ඔහු සමීප කරගත් දෑ හා දැනුම ලද්දා හෝ දැනුම හදාරන්නා හැර."
[حسن] [رواه الترمذي وابن ماجه]

සැබැවින්ම මෙලොව හා එහි ඇති දෑ අල්ලාහ් විසින් පිළිකුල් කරන ලද්දකි. එමෙන් දොස් පවරන ලද, දුරස් කරන ලද, අත්හැර දමනු ලද්දකි. එහි ඇති දෑ ද ඔහු ඉදිරියේ ප්රශංසාවට ලක් නො වන, අත්හැර දමනු ලද්දකි. මක්නිසාදයත් එය හා එහි ඇති දෑ උත්තරීතර අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් මිනිසා දුරස් කරන බැවින් හා වෙනතකට යොමු කරන බැවිනි. නමුත් අල්ලාහ්ව මෙනෙහි කිරීම, අල්ලාහ් ප්රිය කරන දැයින් සමීප කරගත් හා ළං කරගත් දෑ හෝ ආගමික දැනුම ලැබ එය උගන්වන්නා හෝ දැනුම හදාරන්නා හැර යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දැනුම් දුන්හ.

http://sunnah.global/hadeeth/si/show/3788